# පිරිසුදු දේශපාලනයක් ඇති කිරීමට නම් සියලු අපේක්ෂකයන් අගෝ.05ට පෙර වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදිය යුතුයි

## – පැෆරල් සංවිධානය

● ඉන්දික හේවාවිතාරණ

පිරිසුදු දේශපාලනයක් ඇති කිරීමට කටයුතු කරනවා නම් සියලුම අපේක්ෂකයන් අගෝස්තු 05 වැනි දිනට පෙර මැතිවරණ කොමිෂන් සභාවට තම වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු බව පැෆරල් සංවිධානය සඳහන් කරයි.

මීට අමතරව මාර්තු 12 ව්‍යාපාරයට වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදෙන ලෙසට අපේක්ෂකයන්ගෙන් විවෘත ඉල්ලීමක් කර තිබෙන බවත්, මේ අනුව දැනටමත් අපේක්ෂකයන් කිහිපදෙනෙකු වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී තිබෙන බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

ඡන්ද විමසීමෙන් පසුව මැතිවරණ කොමිසමට වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදුන් අපේක්ෂකයන්ගේ හා නොදුන් අපේක්ෂකයන්ගේ නාමලේඛනයක් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ලබාගැනීමට කටයුතු කරන බවද ඔහු පවසා සිටියේය.

ඉන්පසුව වත්කම් බැරකම් ප්‍රකාශ ලබානොදුන් අපේක්ෂකයෙකු මහජන නියෝජිතයෙකු බවට පත් වී සිටියහොත් ඔහුට එරෙහිව අල්ලස් කොමිසමට පැමිණිලි කරන බවද ඒ මහතා සඳහන් කළේය.

අල්ලස් කොමිසම හරහා සිදු කරන නීතිමය කටයුතුවලට අනුව වත්කම් බැරකම් ප්‍රකාශ ලබා නොදුන් මහජන නියෝජිතයන්ට තම මන්ත්‍රී ධුරය පවා අහිමි වී යා හැකි බවද හෙතෙම පවසා සිටියේය.